# දිස්ත්‍රික් ලේකම් කාර්යාලය-බදුල්ල

## සැපයුම්කරුවන්/ සේවා සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම-2025

බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට හා බදුල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 15ට (මහියංගන, රිදීමාලියද්ද, මීගහකිවුල, කන්දකැටිය,සොරණාතොට, බදුල්ල, පස්සර, හාලිඇල, වැලිමඩ, ඌවපරණගම, බණ්ඩාරවෙල, ඇල්ල, හපුතලේ, හල්දුම්මුල්ල, ලුණුගල) අවශ්‍ය භාණ්ඩ හා සේවා සැපයීම සඳහා 2025වර්ෂය වෙනුවෙන් ලියාපදිංචි වීමට කැමති භාණ්ඩ සැපයුම්කරුවන්/ සේවා සැපයුම්කරුවන් සහ කොන්ත්‍රාත්කරුවන් සඳහා පහත දැක්වෙන සැපයුම්/ සේවා සැපයුම් හා ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් ලියාපදිංචි කිරීම සඳහා **2024.11.30** දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

**භාණ්ඩ සැපයුම්**

1. ලිපි ද්‍රව්‍ය හා කාර්යාලයීය අවශ්‍යතා
   ඡායාපිටපත් කඩදාසි, පරිගණක මුද්‍රණ කඩදාසි, රබර් මුද්‍රා, බෝල්පොයින්ට් පෑන්, ලිපිගොනු කවර, ඇමුණුම්කටු, ලියුම් කවර, පන්චර්, ස්ටේප්ලර් ආදිය.
2. කාර්යාල උපකරණ
   මේස,පුටු,පරිගණක මේස, පරිගණක පුටු, නාම පුවරු, කාර්යාල බෑග්,ලිපිගොනු රාක්ක, අල්මාරි, කැබිනට්,ඩෙස්,බංකුආදිය
3. පරිගණක සහ පරිගණක ආශ්‍රිත උපකරණ
   පරිගණක, පරිගණක මුද්‍රණ යන්ත්‍ර,පරිගණක ටෝනර් වර්ග,පරිගණක මුද්‍රණයන්ත්‍ර තීන්ත, අනවරත බල සැපයුම් (UPS),ඡායා පිටපත් යන්ත්‍ර,ෆැක්ස් යන්ත්‍ර, රෝනියෝ යන්ත්‍ර,ඕවර් හෙඩ් ප්‍රොජෙක්ටර්, මල්ටි මීඩියා ප්‍රොජෙක්ටර්, අනුපිටපත් යන්ත්‍ර (ඩුප්ලෝ යන්ත්‍ර ) ආදිය
4. විදුලි , විද්‍යුත් උපාංග හානඩත්තු උපකරණ
   විදුලි පංකා බල්බ ඇතුළු විදුලි උපාංග,ගණක යන්ත්‍ර,රූපවාහිනී යන්ත්‍ර,ගුවන්විදුලි යන්ත්‍ර,ඩිජිටල් කැමරා,වීඩියෝ කැමරා,CCTVකැමරා,වායුසමීකරණ යන්ත්‍ර, ශබ්දවාහිනී පද්ධති හානඩත්තු උපකරණ (Tool Kit, Blower, Screwdrivers) ආදිය
5. ව්‍යාපෘති සඳහා අවශ්‍ය උපකරණ
   වඩු උපකරණ, වෑල්ඩින් ප්ලාන්ට්,ඩ්‍රිල්,බර්නර්,ග්‍රයින්ඩර්,ධාන්‍ය පිටිකරන යන්ත්‍ර, ගම්මිරිස් සුදු කරන යන්ත්‍ර, ගම්මිරිස් කරලින් වෙන් කරන යන්ත්‍ර, ගොයම් කොළ මඩින යන්ත්‍ර, බ්ලොක් ගල් සෑදීමේ යන්ත්‍ර, අධි පීඩන ග්‍රීස් විදින යන්ත්‍ර, මල් පෝච්චි අච්චු හා ග්‍රිල් අච්චු, අධි පීඩන ජල පීඩන යන්ත්‍ර, රබර් කර්මාන්තය සඳහා අවශ්‍ය දිය රෝල් හා ඩයමන් රෝල්, මහන මැෂින්, ජුකී මැෂින්, කැටයම් ආයුධ,විදුලිතරාදි, සීලර්,ජල මෝටර් ආදිය
6. ටයර්, ටියුබ්, වාහන බැටරි හා මෝටර් රථ අමතර කොටස්
7. නිළ ඇඳුම් සඳහා රෙදි පිළි හා තිරරෙදි
8. ගොඩනැඟිලි උපකරණ හා ද්‍රව්‍ය
   කළුගල්, ගඩොල්,බොරළු,යකඩ,තාර,සිමෙන්ති, වැලි, ගඩොල්, උළු, තීන්ත, විදුලි උපාංග, ක්ෂේත්‍රයේපාවිච්චියට අවශ්‍ය උපකරණ, ජල ටැංකි, ජලනල උපාංග ආදිය
9. සනීපාරක්ෂක ද්‍රව්‍ය (සබන්,විෂබීජ නාශක ද්‍රව්‍ය,වැසිකිළි සෝදන දියර, ,කසල බඳුන්,ඉදල්,කොසු හා පාපිසි ආදිය)
10. පොහොර හා කෘෂි රසායනික ද්‍රව්‍ය
11. ගිනි නිවන උපකරණ
12. ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා අවශ්‍ය දැව (ලී , ලෑලි )
13. මිනිස් පරිභෝජනය සඳහා සුදුසු පිසූ ආහාර / පානීය ජලය /සකස්කළ කිරි සැපයීම(කෙටි ආහාර, දිවා ආහාර,ජල බෝතල්,කිරිපැකට්,යෝගට් හා බේකරි නිෂ්පාදන ආදිය)
14. මිනිස් ආහාර සඳහා වියලි ආහාර ද්‍රව්‍ය සැපයීම(හාල්, රතු පරිප්පු, මුං ඇට, කවුපි, කඩල, සෝයා,සැමන් ටින්, වියලි හාල් මැස්සෝ,බිත්තර, කුරක්කන්, උඳු, රටකජු ආදිය)
15. පෙරදිග හා අපරදිග සංගීත භාණ්ඩ
16. ක්‍රීඩා උපකරණ හා සෙල්ලම් බඩු (ළමා උද්‍යාන හා ව්‍යායාම් උපකරණ ආදිය)
17. ලී බඩු උපකරණ (ඩෙස්,බංකු,මේස,පුටු ආදිය)
18. කැනපි හට්, කූඩාරම් හා බුෆේ සෙට්
19. හරිතාගාර උපකරණ (යූ.වී පොලිතීන්, කෘමි ප්‍රතිරෝධක දැල්)
20. කොන්ක්‍රීට් බෝක්කු බට, කොන්ක්‍රීට් කණු ආදිය

21. ස්වයංරැකියා සඳහා ඇති කරන සතුන් (කිකිලි පැටවි, කිරි ගවයින්,මාළු පැටවි, එළුවන් ආදිය)
22. රූපලාවන්‍ය උපකරණ (මේකප් සෙට්, සැලෝන් උපකරණ ආදිය)
23. ඇඟලුම් නිෂ්පාදන ( පාවහන්, බෑග්,කුඩ, වැහි කබා ආදිය)
24. කෘෂිකාර්මික ව්‍යාපෘති උපකරණ
(උදලු,කැති,වීල්බැරෝ,වතුර මෝටර්,මුල්ලු,අලවංගු,රේක්කආදිය)
බද්ධ කරනු ලැබූ පැළ වර්ග
(සුළු අපනයන භෝග පැළ වර්ග, තේ පැළ, පළතුරු පැළ මල් පැළ ආදී විවිධ පැළ වර්ග) හා විවිධ වර්ගයේ බීජ)
25. ප්‍රතිආශ්‍රැතකරණ ජල පෙරන පද්ධතිය ස්ථාපිත කිරීම
26. සූර්ය පැනල් සවිකිරීම

**<u>සේවා සැපයුම්</u>**

1. ඡායා පිටපත් යන්ත්‍ර , මුද්‍රණ යන්ත්‍ර , පරිගණක හා අනුපිටපත් යන්ත්‍ර අලුත්වැඩියාව හා සේවා කිරීම
2. විදුලි උපකරණ, ශබ්ද වාහිනී උපකරණ, වායු සමීකරණ යන්ත්‍ර, ජෙනරේටර්, විදුලි සෝපාන,CCTVකැමරාහා ශීතකරණ අළුත්වැඩියා කිරීම හා සේවා කිරීම,
3. ගිණි ආරක්‍ෂණ පද්ධතිය නඩත්තු හා සේවා කිරීම
4. විදුලි පරිපථ, ජල නල හා ජල පොම්ප අළුත්වැඩියාව
5. මෝටර් රථ සේවා කිරීම,අළුත්වැඩියා කිරීම (තහඩු වැඩ හා පින්තාරු කිරීම, වායු සමීකරණ පද්ධතිය අලුත්වැඩියා කිරීම, ආසන කුෂන් කිරීම හා කවර දැමීම, විදුලි පද්ධතිය අලුත්වැඩියා කිරීම, අමතර කොටස් සැපයීම)
6. කාර්යාල භාණ්ඩ හා උපකරණ අළුත්වැඩියාව හා ආසන කුෂන් කිරීම
7. මුද්‍රණ කටයුතු, පොත් බැඳීම, සමරු ඵලක සෑදීම (ඔෆ්සෙට් මුද්‍රණ ඇතුළුව),ඡායාරූප රාමුකිරීම,කාර්යාල හැඳුනුම්පත් සකස් කිරීම හා නාම පුවරු සකස් කිරීම (ඩිජිටල් මුද්‍රණ කටයුතු), සහතික මුද්‍රණ කටයුතු, බැනර් මුද්‍රණ කටයුතු
8. පරිගණක මෘදුකාංග අළුත්වැඩියාව
9. ගස් කැපීම, බැකෝ යන්ත්‍ර සැපයීම, එක්ස්කැවේටර් යන්ත්‍ර,මාර්ග තලන,ඩෝසර් යන්ත්‍ර, මෝටර් ග්‍රේඩර් හා ටිපර් රථ ආදීයසැපයීම
10. පරිගණක ජාලගත කිරීම
11. ශබ්ද විකාශන යන්ත්‍ර සැපයීම
12. කුලී පදනම මත වාහන ලබා ගැනීම - (කාර්, වෑන්, ලොරි, බස් රථ,කැබ්රථ ආදිය)
13. පරිගණක පුහුණු ආයතන
14. රියදුරු පුහුණු ආයතන (බර වාහන, බැකෝ, එස්කැවේටර් ආදිය)
15. උත්සව අවස්ථා සඳහා භාණ්ඩ සැපයීම (පැරබෝලික් කූටි, වේදිකා, තාවකාලික ප්‍රදර්ශන කුටි, හට්, කේටරින් සර්විස්, බුෆේ සෙට්, පුටු, මේස,වායුසමීකරණ,ඩිජිටල් තිරභාබුමුතුරුණු ආදිය)
16. ආරක්ෂක සේවා
17. සනීපාරක්ෂක සේවා
18. ග්‍රිල් ගේට්ටු ඇතුළු සුදු යකඩ වැඩ සේවාවන්
19. මෘදුකාංග (Zoom යන ආදි) සැපයීම

**<u>ඉදිකිරීම් කටයුතු</u>**

ගොඩනැගිලි, මාර්ග හා ඇලවේලි ඉදිකිරීම් කටයුතු හා අලුත්වැඩියා කටයුතු**(ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි වී ඇති ආයතන හා ලියාපදිංචි සමිති)**

1. සුළු ඉදිකිරීම් රු.ලක්ෂ 5 ට අඩු කොන්ත්‍රාත්(ඉක්ටෑඩ් ලියාපදිංචිය අවශ්‍ය නොවේ)
2. මධ්‍යම මට්ටමේ ඉදිකිරීම් රු.ලක්ෂ 5 සිට මිලියන 3.5දක්වා (ඉක්ටෑඩ් ලියාපදිංචිය අත්‍යවශ්‍ය වේ)
3. විශාල ඉදිකිරීම් රු.මිලියන 3.5සිට රු.මිලියන 10 දක්වා(ඉක්ටෑඩ් ලියාපදිංචිය අත්‍යවශ්‍ය වේ)

අයිතම ගණනාවක් සඳහා ලියාපදිංචි වීම අපේක්ෂා කරන අයදුම්කරුවන් එක් අයිතමයක් සඳහා අයදුම්පත් එක බැගින් ඉදිරිපත් කළ යුතු අතර, ලියාපදිංචි අපේක්ෂා කරනු ලබන එක් අයිතමයක් සඳහා අයැදුම්පත් ගාස්තුව රු. 500.00 බැගින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල සරප් වෙත රාජකාරි දිනයන්වලදී උදෑසන 8.30සිට සවස 15.00 පැය දක්වා මුදල්

ගෙවා අයදුම්පත්‍රය ලබා ගත යුතුය. **(මුදල් ඇණවුම් භාරගනු නොලැබේ)**අයදුම් පත්‍රය සමඟ අදාල රිසිට් පත ඇමිණිය යුතුය.)නැතහොත් ලංකා බැංකුව බදුල්ල ශාඛාවේ ගිණුම් අංක 7042240 දරන බදුල්ල දිස්ත්‍රික් ලේකම්ගේ නිළ බැංකු ගිණුමට බැර කර අදාල රිසිට්පත අයදුම් පත්‍රය සමඟ ඇමිණිය යුතුය.**(චෙක් පත් සමඟ ඉදිරිපත් කරනු ලබන අයදුම් පත් නිකුත් කරනු ලබන්නේ අදාල චෙක්පත් උපලබ්ධි වූ පසුව පමණි. ඒ සමඟ ආපසු යවන, මුද්දර සහිත ලිපි කවරයක් අමුණා එවිය යුතුය)**

2025වර්ෂය සඳහා ලියාපදිංචි වීමට අවශ්‍ය අයදුම්පත බදුල්ල දිස්ත්‍රික් ලේකම්ගේ www..badulla.dist.gov.lk යන වෙබ් අඩවියෙන් භාගතකරගෙන නියමිත මුදල් බැංකුව වෙත ගෙවා ලබාගත් කුවිතාන්සිය අයදුම්පත සමඟ ඉහත සඳහන් ලිපිනයට එවීමෙන්ලියාපදිංචි විය හැකිය.

**අයදුම්කරුගේ අවශ්‍යතාවය පරිදි ඉහත ලිපිනය දරණ වෙබ් අඩවියෙන් භාගතකරනු ලබන අයදුම්පත නිසි පරිදි සම්පූර්ණ කර නියමිත පරිදි මුදල් ගෙවා ලබාගත් කුවිතාන්සියේ පිටපතක්ද සමඟින් cacc.badulla@gmail.comදරණ විද්‍යුත් ලිපිනයට යොමුකල හැකි අතර,එසේ යොමු කිරීමේදි subjectයන ස්ථානයේ "සැපයුම්කරුවන් ලියාපදිංචිය 2025"යන ලෙස සඳහන් කිරීම අනිවාර්ය වේ..එසේ නොමැතිව ලැබෙන අයදුම්පත් සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී යම්කිසි ප්‍රමාදයන් සිදුවුවහොත් ඒ සම්බන්ධයෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වග කියනු නොලැබේ.**

සුළුඉදිකිරීම්රු.ලක්ෂ5 ට අඩු කොන්ත්‍රාත් සඳහා ලියාපදිංචි වීම අපේක්ෂා කරන අයදුම්කරුවන්ගේ ලියාපදිංචි අයැදුම්පතට අදාළ ගාස්තුව රු.200.00 ක් වේ.

**2024 වර්ෂය සඳහා මේ වන විට බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ලියාපදිංචි සැපයුම්කරුවන්ට 2025 වර්ෂය සඳහා ව්‍යාපාරය පවත්වාගෙය යාමට ලබාගත් බලපත්‍රයේ පිටපතක් සමඟ අදාල ලියාපදිංචි ගාස්තුව ගෙවීමෙන් ලියාපදිංචිය අළුත්කරගත හැකි අතර,නැවත 2025 වර්ෂය සඳහා ලියාපදිංචි වීමට අයදුම්පතක් ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ. මෙලෙස ලියාපදිංචි වීමට හැකි අයදුම්කරුවන් මේ වන විටත් ලියාපදිංචිව සිටින එක් එක් කාණ්ඩ වලට අදාලව වෙන වෙනම මුදල් ගෙවීම් සිදුකළ යුතුය.අළුතින් වෙනත් කාණ්ඩයක් යටතේ ලියාපදිංචි වීමට අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා නව අයදුම්පතක් ඉදිරිපත් කල යුතුය.**

සියලුම අයදුම්පත් 2024 නොවැම්බර් 30 දිනට හෝ ඊට පෙර දිස්ත්‍රික් ලේකම් වෙත ලැබෙන සේ **"දිස්ත්‍රික් ලේකම්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, බදුල්ල"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ රැගෙනවිත් භාරදිය හැකිය.අයදුම්පත් එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"2025 වසර සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම"** යනුවෙන් පැහැදිළිව සඳහන් කළ යුතු වේ.අයිතම ගණනාවක් සඳහා ලියාපදිංචි වීමට අපේක්ෂාකරන අයදුම්කරුවන් එක් එක් අයිතමය සඳහා වෙන වෙනම අයදුම්පත් සකස්කර එම අයදුම්පත් වෙන වෙනම ලිපිකවරවල බහා එම ලිපිකවරවල ඉහල වම් කෙලවරේ අයිතමයේ නම සඳහන් කර ඒ සියළු ලිපිකවර එක් කවරයක බහා ඉදිරිපත් කල යුතුය.

සාමාන්‍යයෙන් ලියාපදිංචි සැපයුම්කරුවන්ගේ ලැයිස්තුවෙන් පමණක් මිල ගණන් කැඳවනු ලැබේ.එහෙත් දිස්ත්‍රික් ලේකම්ට අවශ්‍ය යැයි හැඟෙන අවස්ථාවන්හිදීවෙනත් සැපයුම්කරුවන්ගෙන්ද මිල ගණන් කැඳවනු ලැබේ.මිලදී ගැනීමේ අයිතිය දිස්ත්‍රික් ලේකම් සතුය.

අයැදුම්පතෙහි දක්වා ඇති ලිපිනයට පමණක් මිලගණන් කැඳවීමේ ලිපි යැවීමට දිස්ත්‍රික් ලේකම් බැඳී සිටී.වසර ඇතුළත ලිපිනය වෙනස් වන විට එම ලිපින දිස්ත්‍රික් ලේකම් වෙත දැනුම් දීමට ලියාපදිංචිකරුවන් වගබලා ගතයුතුය.

සැපයුම්කරුවන්ගේ මිල ගණන් අවම වශයෙන් මාස 3කට වලංගු විය යුතුය.

විනිමය අනුපාත වෙනස්වීම්, රජයේ බදු ප්‍රතිපත්තිවල වෙනස්වීම් හා සුවිශේෂී රටටම බලපාන හේතුවලට අනුව සිදුවන වෙනස්වීම් හැර, මිල වෙනස්වීම් හෝ වෙනයම් හේතූන්මත සැපයුම ප්‍රතික්ෂේප කරන සැපයුම්කරුවන්ගේ ලියාපදිංචිය වහාම අවලංගු කරනු ලැබේ.

දිස්ත්‍රික් ලේකම් තෘප්තියට පත්වන පරිදි මිල ගණන් ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු අතර, භාර දුන් ඇණවුම් සැපයීමට අපොහොසත්වන සැපයුම් හා සේවා කරුවන්ගේ නම් කිසිදු පූර්ව දැනුම් දීමකින් තොරව ලැයිස්තුවෙන් කපා හරිනු ලැබේ.ලියාපදිංචිය සඳහා එවනු ලබන අයදුම්පත් කිසිදු හේතු දැක්වීමකින් තොරව පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ දිස්ත්‍රික් ලේකම් සතුවේ.

පණ්ඩුක ශ්‍රී ප්‍රභාත් අබේවර්ධන,,
දිසාපති / දිස්ත්‍රික්ලේකම්
සභාපති ප්‍රසම්පාදන මණ්ඩලය,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, බදුල්ල.
2024.10.30